# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/1/47 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.07.12 |

දකුණු පළාත් සභාවේ සියළුම,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් /ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.

**<u>දකුණු පළාත් සභාව මඟින් සංවිධානය කරනු ලබන විශේෂ උත්සව - රැස්වීම් - වැඩමුළු - සාකච්ඡා සඳහා වන වියදම් පාලනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/SP/5 හා 2017.07.06 දිනැති ලිපිය හා බැඳේ. ( එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි).

02. වර්තමානය වන විට මෙම පළාත් සභාව සඳහා මුදල් කොමිෂන් සභාවෙන් සහ භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලබා දෙන මුදල් ප්‍රතිපාදන ඉතා විශාල වශයෙන් සීමා කර ඇති බැවින්, පළාත් සභාවට දැඩි මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇත.

03. දකුණු පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතිව, දකුණු පළාත් සභාව මඟින් සංවිධානය කරනු ලබන උත්සව, රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ.... ආදිය පළාත් සභාවට අයත් හෝ රජයට අයත් පහසුකම් සහිත ආයතන පරිශ්‍ර තුල පවත්වන ලෙසත්, අදාළ සංග්‍රහ කටයුතු විධිමත් ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් අවස්ථාවෝචිත පරිදි සිදුකරන ලෙසත්, ගරු ආණ්ඩුකාරතුමා විසින් උක්ත ලිපිය මඟින් දැනුම් දී ඇත.

04. දකුණු පළාත තුල විදේශීය අමුත්තන්ගේ සහභාගීත්වය ඇතිව පළාත් සභාව විසින් සංවිධානය කරනු ලබන විශේෂ උත්සව, රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ.... ආදිය ඉහත රජයේ ආයතනවලින් පරිබාහිර හෝටලයක හෝ වෙනත් සුදුසු පෞද්ගලික ආයතනයක පැවැත්වීම අත්‍යාවශ්‍ය වන අවස්ථාවලදී ඒ සඳහා වන ඇස්තමේන්තු කල්වේලා ඇතිව ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව පමණක් ඉදිරි කටයුතු සිදුකරන ලෙස වැඩිදුරටත් දන්වා එවා ඇත.
එබැවින් ඔබ ආයතනය මඟින් උත්සව , රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ වැනි කටයුතු සංවිධානය කිරීමේදී ගරු ආණ්ඩුකාරතුමා විසින් නිකුත් කර ඇති මෙම උපදෙස් තරයේ පිළිපදින ලෙස කාරුණිකව දන්වමි.

මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන ප්‍රධානීන් ඇතුළු අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසද වැඩි දුරටත් දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත 01. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත - දැ.ගැ.ස.
02. ප්‍රධාන ලේකම් කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැ.ගැ.ස.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

ආචාර්ය හේමකුමාර නානායක්කාර (පී.එච්.ඩී.)
கலாநிதி ஹேமகுமார நானாயக்கார (பீ.எச்.டீ.)
Dr. Hemakumara Nanayakkara (PhD)

දකුණු පළාත් ආණ්ඩුකාරවර
தென் மாகாண ஆளுநர்
GOVERNOR-SOUTHERN PROVINCE

මගේ අංකය / எனது இல. / My No. } G/SP/5

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017/07/06

ආර්.සී.ද සොයිසා මහතා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

<u>දකුණු පළාත් සභාව මඟින් සංවිධානය කරනු ලබන විශේෂ උත්සව - රැස්වීම් - වැඩමුළු- සාකච්ඡා සඳහා වන වියදම් පාලනය කිරීම.</u>

වර්තමානය වන විට දකුණු පළාත් සභාව සඳහා මුදල් කොමිෂන් සභාවෙන් සහ මහා භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලබා දෙන මුදල් ප්‍රතිපාදන ඉතා විශාල වශයෙන් සීමා කර ඇති බැවින් දකුණු පළාත් සභාව දැඩි මූල්‍ය දුෂ්කරතාවයකට මුහුණ පා ඇති බව මා වෙත වාර්තා වී ඇත.

02. පළාත්  රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතිව දකුණු පළාත් සභාව මඟින් සංවිධානය කරනු ලබන උත්සව, රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ .... ආදිය පළාත් සභාවට අයත් හෝ රජයට අයත් පහසුකම් සහිත ආයතන පරිශ්‍ර තුළ පවත්වන ලෙසත්, අදාළ සංග්‍රහ කටයුතු විධිමත් ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් අවස්ථාවෝචිත පරිදි සිදුකරන ලෙසත් මෙයින් ඔබ වෙත දැනුම් දෙමි.

03 . දකුණු පළාත තුළ විදේශීය අමුත්තන්ගේ සහභාගීත්වය ඇතිව පළාත් සභාව මඟින් සංවිධානය කරනු ලබන විශේෂ උත්සව රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ... ආදිය ඉහත රජයේ ආයතන වලින් පරිබාහිර හෝටලයක හෝ වෙනත් සුදුසු පෞද්ගලික ආයතනයක පැවැත්වීම අත්‍යාවශ්‍ය වන අවස්ථා වලදී ඒ සඳහා වන ඇස්තමේන්තු කල්වේලා ඇතිව මා වෙත  ඉදිරිපත් කර  මාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පමණක් ඉදිරි කටයුතු සිදුකරන ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.

මේ සම්බන්ධයෙන් දකුණු පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

ආචාර්ය හේමකුමාර නානායක්කාර
ආණ්ඩුකාරවර
දකුණු පළාත.

ආචාර්ය හේමකුමාර නානායක්කාර
ආණ්ඩුකාරවර
දකුණු පළාත

ආණ්ඩුකාරවර කාර්යාලය, පහළ ඩික්සන් පාර, ගාල්ල.
දුරකථන : 091 2234578
ෆැක්ස් : 091 2227228
විද්‍යුත් තැපෑල : governorsp@sltnet.lk

ஆளுநர் அலுவலகம், கீழ் டிக்ஸன் வீதி, காலி.
தொலைபேசி : 091-2234578
தொலைநகல் : 091-2227228
மின்-அஞ்சல் : governorsp@sltnet.lk

Governor's Office, Lower Dickson Rd, Galle.
Tel : 091-2234578
Fax : 091-2227228
E-mail: governorsp@sltnet.lk